# ළමා වියේදී ලිංගික අපයෝජනයට ලක්වන වින්දිතයින්ගේ පුනර්වින්දිතභාවය හා සුරක්ෂණය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්)

*එච්.පී.බී.සී. සෙව්වන්දි [1], ඒ.වයි.එන්.එච්. තරුෂිකා [2], එස්. නිලුෂිකා දිල්මිණි [3], ඩබ්.එම්.ඒ.ඩී. මුණසිංහ [4]*

වර්තමාන සමාජ සන්දර්භයෙහි ළමා ලිංගික අපයෝජන සුලභ වීම යන තත්ත්වය මූලික කරගනිමින් ළමා වියේදී ලිංගික අපයෝජනයට පත්වූ වින්දිතයකු දීර්ඝ කාලීනව පුනර්වින්දිතභාවයට පත්වීම හා එමගින් වින්දිතයන්ට සිදුවන සමාජ හා සංස්කෘතිකමය බලපෑම පිළිබඳව මෙම අධ්‍යයනය සිදුකර ඇත. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ළමා වියේදී ලිංගික අපයෝජනයට  ලක් වූ වින්දිතයින් පුනර්වින්දිතභාවයට ලක් කරන සමාජ සංස්කෘතික සාධක හඳුනා ගැනීමයි. සෙසු අරමුණු වන්නේ පුනර්වින්දිතභාවය හරහා වින්දිතයාගේ ආකල්ප හා සමාජ අන්තර්ක්‍රියා පැවැත්වීමේ වෙනස්කම් අධ්‍යයනය කිරීම, ළමා ලිංගික අපයෝජනයට ලක්වූ වින්දිතයින් පුනර්වින්දිතභාවයෙන්  සුරක්ෂණයට පවතින හිඩැස් හඳුනා ගැනීමයි. ඒ අනුව ගම්පහ දිස්ත්‍රික්කයේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පුද්ගලයන් පහළොස් දෙනෙකුගෙන් යුක්ත අරමුණු සහගත නියැදියක් යොදාගෙන ඇති අතර ගුණාත්මක අධ්‍යයන ක්‍රමය ඔස්සේ පර්යේෂණය සිදුකර ඇත. ගැඹුරු සම්මුඛ සාකච්ඡා මගින් රැස් කරගත් දත්ත තේමා විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණය කර ඇත. සමස්ත අධ්‍යයනය හරහා ළමා වියේදී ලිංගික අපයෝජනයට පත්වන වින්දිතයකු ප්‍රේම සම්බන්ධතා හා විවාහය යන  කාරණාවලදී මෙන්ම රැකියාව සමග සම්බන්ධ වීම ආදී සමාජගත වීම්වලදී පුනර්වින්දිතභාවය ගොඩනැගෙන බව හා  පුනර්වින්දිතභාවය තුළින් අඛණ්ඩ අධ්‍යාපනය බිඳවැටීම අධ්‍යයනයේදී අනාවරණය විය. එමෙන්ම වින්දිතයා ලේබල්කරණයට ලක් වීම හරහා පුනර්වින්දිතභාවයට ලක්වන බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. සුරක්ෂණයේ පවතින හිඩැස් පිළිබඳව අවධානය යොමු කිරීමේදී වින්දිතයාගේ මානසික තත්ත්වය සාමාන්‍යකරණයට පත් කිරීම මගින් සමාජගත වීමට බලපාන සෘණාත්මක ආකල්ප අවම කරමින් පෞරුෂත්වය සංවර්ධනය සඳහා මූලිකත්වය ගන්නා ස්වේච්ඡා සංවිධානවල ක්‍රියාකාරීත්වය පුළුල් විය යුතු බවත්, විශේෂයෙන්ම නෛතික ප්‍රතිපාදන පුළුල් කරමින් නඩු විභාග සඳහා ගතවන කාලසීමාව හැකිතාක් අවම කිරීමට ආයතනික මට්ටමෙන් කටයුතු කිරීම ආදී අවශ්‍යතාවයන් සුරක්ෂණය හිඩැස් ලෙස මතුවිය. පුනර්වින්දිතභාවය මූලික කරගනිමින්  වින්දිතයා තුළ පිරිමින්ට ඇති බිය, සමාජගත වීමට ඇති බිය වැනි තත්ත්වයන් මෙන්ම හුදෙකලාවට ඇති කැමැත්ත හා දීර්ඝ කාලීන මානසික වශයෙන් ඇතිවන රෝගී තත්ත්වයන්ට ගොදුරු වී ඇති බව  ප්‍රතිඵල ලෙස අධ්‍යයනයේදී හඳුනාගත හැකි විය. අධ්‍යනයේ නිගමනය වන්නේ ළමා වියේදී ලිංගික අපයෝජනයට ලක්වන වින්දිතයා පුනර්වින්දිතභාවයට පත්වීම වැළැක්වීම හා වින්දිතයාගේ සුරක්ෂණය උදෙසා ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ සමාජය, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් තුළ පවතින අවධානය අවම වී ඇති බවයි.

***ප්‍රමුඛ පද:*** වින්දිතයා, පුනර්වින්දිතභාවය, සමාජය, ළමා අපයෝජන, සංස්කෘතිය

[1] සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. sewwandichammika@gmail.com
[2] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.nilushikadilmini1205@gmail.com